# කම්මැලියන් වෙත පැමිණි විට යහපත් පුද්ගලයා ද පිරිහෙයි

## විමල ස්ථවිර ගාථා ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ථෙරථෙරීගාථාපාළි, ථෙරගාථා, තිකනිපාතය - පිටු අංක 92 - 93)

- නිවන් සුව පතනුයේ පාපමිත්‍රයන් හැර දමා උත්තම පුද්ගලයන් ඇසුරු කරන්නේය. ඒ උත්තම පුද්ගලයන්ගේ අවවාදයෙහි ද සිටින්නේය.
- කුඩා ලී දණ්ඩක නැගී යන්නා මහ මුහුදෙහි ගිලෙන්නේ යම් සේ ද, එසේ ම කම්මැලියා වෙත පැමිණි යහපත් ව දිවි ගෙවන්නා ද පිරිහෙයි. එම නිසා කම්මැලි වූ වීර්ය නැති තැනැත්තා දුරු කරන්නේය.
- කාය විවේකයෙන් යුතු වූ ආර්ය නිවනට යොමු වූ සිත් ඇති ධ්‍යාන කරන සුලු වූ නිරතුරු ආරබ්ද වීර්යයෙන් යුතු පණ්ඩිතයන් සමඟ එක් ව වාසය කරන්නේය.